# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2380/36 - 2024 අප්‍රේල් මස 19 වැනි සිකුරාදා - 2024.04.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත**

53 වන වගන්තිය යටතේ වූ නියමය

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ (පනත) 53 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ නිර්දේශ සැළකිල්ලට ගෙන සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින් -

*(අ)* අමාත්‍ය මණ්ඩලය විසින් 2024 අප්‍රේල් මස 08 වැනි දින අංක 24/0630/631/014 දරන තීරණය මගින්, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති බලයලත් තැනැත්තාගේ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කිරීම අනුමත කර ඇති බවටත් ;

*(ආ)* ඒ ව්‍යාපාරය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වන බවටත් ;

*(ඇ)* පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු බවටත් ; සහ

*(ඈ)* නිශ්චිතව දක්වා ඇති පනත් යටතේ ප්‍රදානය කරන ලද නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති දිනවල දී ආරම්භ විය යුතු බවට සහ ක්‍රියාත්මකවීම අවසන් විය යුතු බවටත්,

නිශ්චිතව දක්වමි.

රනිල් වික්‍රමසිංහ,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 අප්‍රේල් මස 19 වැනි දින,
කොළඹ දී ය.

1A - PG 6700 — 289 (2024/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| ***I* වන උපලේඛනය**<br>*ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස නම් කර ඇති ව්‍යාපාරයේ විස්තර* | |
|---|---|
| 1. බලයලත් තැනැත්තාගේ නම : | පෝර්ට් සිටි බීපීඕ (ප්‍රයිවට්) ලිමිටඩ් |
| 2. බලපත්‍ර අංකය : | 2311280033 |
| 3. බලයලත් තැනැත්තාගේ බලපත්‍රය නිකුත්කරන ලද දිනය | 2023 දෙසැම්බර් 01 බලපත්‍රය නිකුත් කරන ලද දින සිට මාස 6ක් ඇතුළත වූ දිනයක දී ව්‍යාපාරය ආරම්භ කළ යුතු ය.<br>(2022 අංක 01 දරන බලයලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ, බලපත්කරණ, බලය පැවරීමේ හා සෙසු අනුමැතීන් සඳහා වූ නියෝගවල 27 වන නියෝගයට අනුව) |
| 4. අක්වෙරළ සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | පීසීසී 00289735 |
| 5. ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර වර්ගීකරණය | ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරය |
| 6. නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් සඳහා හිමිකම | පෝර්ට් සිටි බීපීඕ (ප්‍රයිවට්) ලිමිටඩ් ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස පමණක් නම් කරනු ලැබ ඇති අතර, එය ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ප්‍රාථමික ව්‍යාපාරයක් ලෙස නම් කරනු ලැබීමට සුදුසුකම් නොලබයි. |
| 7. සුදුසුකම් ලැබීමේ නිර්ණායක | 2023 අගෝස්තු මස 4 වන දින අංක 2343/60 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 4(2)(ඉ) සහ 4(3)(ආ) වන නියෝගවල නිශ්චිතව දක්වා ඇති නිර්ණායක |
| 8. අදාළ වන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් යෝජනා ක්‍රමය | 2023 අංක 2 දරන කොළඹ වරාය නගරය (ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාර සඳහා නිදහස් කිරීමේ හෝ දිරිගැන්වීම් ප්‍රදානය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ) නියෝගවල 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යෝජනාක්‍රමය. |

### *II* වන උපලේඛනය

*ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ද්විතීයික ව්‍යාපාරයක් ලෙස සැලකීමට හේතු*

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 53(5) වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, ජාතික යහපත සැලකිල්ලට ගනිමින් හෝ ජාතික ආර්ථිකය දියුණු කිරීම සඳහා කොළඹ වරාය නගරය ස්ථාපිත කිරීමේ සාර්ථකත්වය සහතික කිරීම පිණිස, ව්‍යාපාරය, ක්‍රමෝපාය වැදගත්කමක් ඇති ව්‍යාපාරයක් ලෙස නම් කිරීමේ දී එම පනතේ 5 වන වගන්තියේ දක්වා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවේ අරමුණු සලකා බලා ගෙන ඇත.

පෝර්ට් සිටි බීපීඕ (ප්‍රයිවට්) ලිමිටඩ්, සිංගප්පූරුවේ Aitken Spence International PTE LTD සහ මැලේසියාවේ IRIS corporation BHD සමාගම් විසින් ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද සමාගමක් වන අතර විදේශ විනෝදාස්වාද කර්මාන්තය සඳහා ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීමේ හවුල් සේවාවන් සැපයීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත. එජඩො 500,000 ක මූලික ආයෝජනයක් සිදු කරමින් කොළඹ වරාය නගරය තුළ සිය මෙහෙයුම් ආරම්භ කරන පළමු වර්ෂය තුළ දී පුද්ගලයන් 300 දෙනෙකු සේවයේ නියුක්ත කරවීමට ද, දෙවන වර්ෂයේ දී රැකියා අවස්ථා 400ක් ද, පසුව එළඹෙන එක් එක් මෙහෙයුම් වර්ෂ 3 සඳහා රැකියා අවස්ථා 500, 600 සහ 700 බැගින්ද ඇති කරමින් සිය මෙහෙයුම් ආරම්භ කර පළමු වසර 5 තුළ දී රැකියා 2500ක් නිර්මාණය කිරීමේ සුවිශේෂී සන්දිස්ථානයට එළඹීමට සමාගම අදහස් කර සිටියි. ආර්ථික විවිධාංගීකරණයට සැලකිය යුතු ලෙස දායක වෙමින් විදේශ ව්‍යවහාර මුදල් රට තුළට ගෙනවා ගැනීම මෙහි අපේක්ෂිත ප්‍රතිලාභයකි. පළමු වර්ෂ 5 තුළ එජඩො මිලියන 105 ක ආදායමක් උපයා ගැනීමට සැලසුම් කර ඇති අතර එය කොළඹ වරාය නගරයේ ආර්ථික සංවර්ධනයට ඉතා වැදගත් දායකත්වයක් දක්වනු ඇත.

ව්‍යාපාර ක්‍රියාවලි බාහිර ප්‍රභවයන්ට දීමේ (BPO) කර්මාන්තය තුළ රැකියා උත්පාදනය මගින්, 200කට වැඩි තොරතුරු තාක්ෂණය ආශ්‍රිත උසස් ගණයේ විශේෂිත රැකියා අවස්ථා ප්‍රමාණයක් ඇතුළුව, විවිධ රැකියා අවස්ථාවන් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වේ. මෙම දැනුම් හුවමාරුව නවෝත්පාදනය සහ තාක්ෂණය යන අංශවල අභිවෘද්ධිය උදෙසා බෙහෙවින් ඉවහල් වන සාධකයක් වනු ඇත. නවීන තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය එකට ඒකාබද්ධ වීම කොළඹ වරාය නගරයේ තාක්ෂණය මගින් ක්‍රියාත්මක වන වෙනත් කර්මාන්තවලට ද සාධනීය පිරිතිරිය බලපෑමක් ඇති කරයි. මෙය, සංස්ථානික මූලස්ථාන මෙහෙයුම් සහ කලාපීය බෙදාහැරීමේ මෙහෙයුම් පිහිටුවීම කෙරෙහි වූ උද්වේගය හා බැඳුනු විට, එමගින්, ආයතනික වර්ධනය වැඩිදියුණු කරමින් සහ තිරසර ආර්ථික සංවර්ධනයට සහ රැකියා නිර්මාණය කිරීමට දායකත්වය සපයමින්, කොළඹ වරාය නගරය BPO ආශ්‍රිත කටයුතු සඳහා මධ්‍යම කේන්ද්‍රස්ථානයක් බවට පත් කරනු ඇත.

*III වන උපලේඛනය*

*පනත් යටතේ ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්*

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම් |
|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | *(අ)* සියලු ආදායම්, ලාභ සහ බෙදාදෙනු ලබන ලාභාංශ මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලුම බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය.<br><br>*(ආ)* කරන ලද සියලුම ගෙවීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන සහ දේශීය මිලදී ගැනීම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති බදුවලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන සහ දේශීය මිලදී ගැනීම් මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ හා සේවා ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ව්‍යාපාර ආශ්‍රිත සියලු භාණ්ඩ ආනයන මෙම පනත යටතේ නිශ්චිතව දක්වා ඇති සියලු බදු, තීරුබදු සහ අය කිරීම්වලින් නිදහස් කරනු ලැබිය යුතු ය. |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | මෙම පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2022 ජුනි මස 03 වැනි දින අංක 2282/59 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2022 අංක 1 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග හැර, මේ පනතේ සියලු විධිවිධානවලින් නිදහස් වන්නේ ය. |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | මෙම පනත යටතේ කිසිදු නිදහස් කිරීමක් හෝ දිරිගැන්වීමක් ප්‍රදානය කරනු නොලැබේ. |

*IV වන උපලේඛනය*

*ප්‍රදානය කරනු ලබන නිදහස් කිරීම් හෝ දිරිගැන්වීම්වල වලංගු කාලය*

| පනතේ II වන උපලේඛනයේ ලැයිස්තුගත පනත් | ආරම්භක වන දිනය | අවසන් වන දිනය |
|---|---|---|
| 1. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 2. 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 3. 2002 අංක 11 දරන මුදල් පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 4. 2005 අංක 5 දරන මුදල් පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 5. 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 6. (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 7. 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපළ සංවර්ධන බදු පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 8. 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 9. 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම් සහ සූදු බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 10. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 11. (267 වන අධිකාරය වූ) විනෝද බදු පනත | අදාළ නොවේ | අදාළ නොවේ |
| 12. 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2024 අප්‍රේල් 20 | 2049 අප්‍රේල් 19 |
| 13. 2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත | අදාළ නොවේ | අදාළ නොවේ |

EOG 04 - 0166

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.